# නැගෙනහිර පෙරමුණ දැන් නිහඬද?

සිවනේසතුරෙ‍රෙ චන්ද්‍රකාන්තන් හෙවත් පිල්ලෙයාන්ට සාර්ක් සමුළුව අතරවාරයේදී ඉන්දීය අගමැති මන්මෝහන් සිං මුණ ගැස්වීමට දරන ලද උත්සාහයන් මේ වනවිට ව්‍යර්ථව ඇති බවක් පෙනේ. කොටි සංවිධානයේ පාලනයට යටත්ව තිබූ නැගෙනහිර බොහෝ ප්‍රදේශ මේ වනවිට රජයේ හමුදා පාලනයට නතුව ඇති තත්ත්වයක් යටතේ මහ ඇමති පිල්ලෙයාන් නැගෙනහිර දෙමළ ජනයාගේ නීත්‍යනුකූල නියෝජිතයා වශයෙන් ඉන්දීය පිළිගැනීමට පාත්‍ර කරවීම ඇතැම් විට යෝජිත හමුවේ අභිලාෂයව තිබෙන්නට ඇත. නමුත් කොටි සංවිධානයේ යුද හා දේශපාලන ක්‍රියාකාරකම් උතුරේ පමණක් නොව, නැගෙනහිර ඇතැම් ප්‍රදේශවලදීද මුළුමණින්ම පරාජය කොට නොමැති තත්ත්වයක් යටතේ එවැනි හමුවක් සඳහා ඉක්මන් වීමට ඉන්දියාව කටයුතු නොකිරීම බැලූ බැල්මට සහේතුකය. ඒ වෙනුවට දෙමළ ජාතික සන්ධානය සහ ආනන්දසංගරී මුණගැසීමට සූදානමක් ඉන්දියාව පෙන්නුම් කොට ඇත්තේ මේ නිසා විය හැකිය.

කෙසේ වුවද එළඹෙන මාස කිහිපය තුළ උතුරේ යුද පෙරමුණට අදාළව අවසාන විජයග්‍රහණයේ ශුභාංරංචිය දකුණට ලැබෙනු ඇතැයි යන විශ්වාසය දූන් දූන් වැඩිවෙමින් පවතී. ඒ පිළිබඳ සාමාන්‍ය ජන මනස සූදානම් කරවන ප්‍රකාශ දේශපාලකයින් තරමටම හමුදා ප්‍රධානීන් විසින්ද බහුල වශයෙන් නිකුත් කරනු දූන් පෙනේ. අනෙක් අතින් නැගෙනහිර අවසාන වශයෙන් ජයගෙන ඇතැයි යන මුල් බැසගත් විශ්වාසයද උතුරේ අවසාන ජයක් පිළිබඳ බලාපොරොත්තු ඉහළ නංවා තිබේ. නමුත් සාමාන්‍ය ජනයාට හෙළි නොකෙරෙන, එසේත් නැතිනම් හෙළි කළද ඔවුන් විසින් පිළිගැනීමට මැලිවන යථාර්ථයන් මේ ජනප්‍රිය විශ්වාසයන්ට යටින් පවතී. උතුරේ යුද යථාර්ථයන් පිළිබඳ මතභේදාත්මක අදහස් පළකිරීම තාවකාලිකව පසෙකින් තැබුවද, නැගෙනහිර වසන්ව පවතින යථාර්ථයන් ගැන කතා කිරීම වැදගත්ය. ඒ යථාර්ථයන් දුරදිග යන ප්‍රතිවිපාක ජනිත කරවන්නට සමත් පුපුරන සුළු ඒවාය. 'නැගෙනහිර නවෝදය' පිළිබඳ උත්කර්ෂය යට දනට සඟවනු ලැබ තිබුණද, එළඹෙන වකවානුව තුළ නැගෙනහිර දේශපාලනය හැඩගස්වනු ඇත්තේ මෙම යථාර්ථයන් විසිනි.

## සම්බන්ධන්ගේ අනාවරණය

දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු කණ්ඩායම් නායක, ත්‍රිකුණාමල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. සම්බන්ධන් ජූලි 23 වෙනිදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළේය. කොළඹ ඉංග්‍රීසි සහ දෙමළ භාෂා පුවත්පත් හැරෙන්නට එකදු සිංහල මාධ්‍යයක් හෝ මෙකී ප්‍රකාශය වැදගත් කොට සළකනු ලැබූ බවක් පෙනෙන්නට නොතිබිණ. සම්බන්ධන්ගේ අනාවරණය 'සිංහල විරෝධයේ කෙව්ටෙන්' තලා බැහැර කරන්නට නොහැකි වැදගත් අන්තර්ගතයක් සහිත එකකි. අවම වශයෙන් විචාර බුද්ධියේ අවසාන මාත්‍රය හෝ ඉතිරිව ඇති සැම සිංහල වැසියෙකු විසින්ම ඉවසීමෙන් කියවා බැලිය යුතු යමක් සම්බන්ධන්ගේ කතාවෙහි තිබේ.

දෙමළ ජාතික සන්ධාන මන්ත්‍රීවරයාට අනුව 2006 හා 2007 වසරවල නැගෙනහිර පළාතේ මෙහෙයුම්වලින් සිවිල් වැසියන් 300කට ආසන්න ප්‍රමාණයක් මියගොස් තිබේ. 2007 වසරේ සැප්තැම්බරයේදී ඔහු විසින්ම පාර්ලිමේන්තුවේදී සභාගත කරන ලද නාම ලේඛණයට ඉන් 250ක් ඇතුළත්ව තිබිණ. නමුත් මන්ත්‍රීවරයාගේ ප්‍රකාශයෙහි අඩංගු වැදගත් හෙළිදරව්ව වන්නේ මෙහෙයුම්වලින් දිවි ගළවාගත්තවුන්ගේ ඉරණම පිළිබඳ යථාර්ථයන්ය. මහා පරිමාණ මෙහෙයුම් නිමා වී වසරකට ආසන්න කාලයක් ගතව තිබුණද මෙහෙයුම් හේතුවෙන් අවතැන් වූ බහුතරයක් ජනයා තවමත් පසු වන්නේ සරණාගත තත්ත්වයෙහිය. 2006 අගෝස්තු මාසයේදී මෙහෙයුම් ඇරඹුණු ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ යථාර්ථයන් මේ තත්ත්වය කදිමට විදහා දක්වන සුළුය.

පල්ලකුඩියිරිප්පු ප්‍රදේශයේ අවතැන් පවුල් සංඛ්‍යාව 539කි. නල්ලූර්හී 237කි. පාට්ටාලිපුරම්හී 400කි. කඩ්ඩෛපරිච්චාන් දකුණු ප්‍රදේශයේ 374කි. මේ ප්‍රදේශයන්ගේ නැවත පදිංචි කිරීම් නිල වශයෙන් ආරම්භ කරනු ලැබුණද සැළකිය යුතු පවුල් සංඛ්‍යාවක් තවමත් ස්වකීය ගම්බිම් කරා පැමිණ නැත. නවරත්නපුරම් හා චානෛයූර් ප්‍රදේශයන්හී අවතැන් වූ, පිළිවෙලින් 240ක් සහ 425ක් වූ පවුල්වලට අදාළ කිසිදු පදිංචි කිරීමේ සැළැස්මක් මේ දක්වා ක්‍රියාවට නංවා නොමැත. අනෙක් අතින් අධි ආරක්ෂක කලාප හේතුවෙන් නැවත පදිංචිවීම් සඳහා කිසිසේත් අවසර ලබා නොදෙන පවුල් සංඛ්‍යාව කූනිතිවු ප්‍රදේශයේ 192කි. බටහිර සාම්පූර් ප්‍රදේශයේ 398කි. නැගෙනහිර සාම්පූර් ප්‍රදේශයේ 338කි. කඩට්කාරෙ‍රෙචේනෛ ප්‍රදේශයේ 595කි. උතුරු කඩ්ඩෛපරිච්චාන් ප්‍රදේශයේ 343කි. සමස්තයක් වශයෙන් ගත් කළ මන්ත්‍රීවරයාට අනුව 4000කට නොඅඩු පවුල් ප්‍රමාණයකින් 3000කට ආසන්න පවුල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් නැවත පදිංචිකිරීමේ සැළැස්මක සේයාවක් හෝ විද්‍යාමානව නැත.

## මැයි 30 - විශේෂ ගැසට් නිවේදනය

අවතැන්වූවන්ගේ ඉරණම පිළිබඳ මේ හෙළිදරව් කිරීම් හුදෙක් දෙමළ ජාතික සන්ධාන මන්ත්‍රීවරයා විසින් ප්‍රබන්ධ කරන ලද්දක් නොවේ. සාම්පූර් සහ නැගෙනහිර මුත්තූර් ප්‍රදේශයන් හමුදා අධි ආරක්ෂක කලාපයක් වශයෙන් නම් කිරීම සිදුකරන ලද්දේ ඉකුත් වසරේ මැයි 30 වෙනිදා නිකුත්කරන ලද විශේෂ ජනාධිපති ගැසට් පත්‍රිකාව මගිනි. කෘෂි හා ධීවර කර්මාන්තයෙන් යැපුණු දහස් සංඛ්‍යාත ජනයාට ස්වකීය පාරම්පරික ගම් බිම් ස්ථිර වශයෙන්ම අහිමි කළ අදාළ ගැසට් පත්‍රිකාව විසින් නිශ්චිත වශයෙන් යෝජිත අධි ආරක්ෂක කලාපයේ මායිම් සළකුණු කොට පෙන්වා තිබේ.

එහි නැගෙනහිර මායිම් රේඛාව ෆවුල් තුඩුව, ඉල්ලන්කන්දායි, කල්ලඩිචේනෛ සහ උප්පුරාල් යන ගම්මාන අධි ආරක්ෂක කලාපයට ඇතළත් වන පරිදි ඇඳ තිබේ. එය දකුණින් උප්පුරාල්, සෙල්වනගර්, තෝප්පූර් සහ පච්චනූර් ගම්මාන ආරක්ෂක කලාපයට ඈඳා ඇති අතර කඩ්ඩෛපරිච්චාන් ආරු බටහිර ඉවුර ඔස්සේ අඳිනු ලැබ ඇති එහි බටහිර මායිම් රේඛාව මගින් පච්චනූර්, දකුණු කඩ්ඩෛපරිච්චාන්, මුත්තූර් සහ කඩ්ඩෛපරිච්චාන් ආරු ගං මෝයද එම කලාපය තුළට ඒකාබද්ධ කරනු ලබයි. කලාපයේ උතුරු මායිම් රේඛාව දිවෙන්නේ කොඩ්ඩියාර් බොක්කේ දකුණු ඉවුර ඔස්සේය. එමගින් යළිත් කඩ්ඩෛපරිච්චාන් ආරු ගං මෝයද, සාම්පූර් හා ෆවුල් තුඩුවද ජන ශූන්‍ය අධි ආරක්ෂක කලාපයට ඈඳා ගනු ලබයි. *(Emergency (Muttur (East)/Sampoor High Security Zone) Regulations No.2 of 2007 -* ***අංක 1499/25 අති විශේෂ ගැසට්***

*පත්‍රිකාව 2007 මැයි 30 වන බදාදා)*

ඉකුත් වසරේම ජූනි 18 වෙනිදා ඉන්දියාවේ 'හින්දුස්ථාන් ටයිම්ස්' පුවත්පතට ප්‍රකාශයක් කළ රජයේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිවරයා 'අදාළ කළාපය තුළ යෝජිත වැදගත් ඉදිරිකිරීම්වල ආරක්ෂාවත්, ගම්වැසියන්ගේ ආරක්ෂාවත් සළකා ඔවුන්ගේ ගම් බිම්වල පදිංචියට අවසර ලබා දි නොහැකි බව'' අවධාරණයෙන් ප්‍රකාශ කොට තිබිණ. සම්බන්ධන් මන්ත්‍රීවරයා විසින් ජූලි 23 වෙනිදා පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කරන ලද්දේ මෙම තීන්දු තීරණවල ප්‍රතිවිපාකයන් ය.

## සංවර්ධන සැළසුම් කා සඳහාද?

දෙමළ ජාතික සන්ධාන මන්ත්‍රීවරයාගේ හෙළිදරව් කිරීම් පළමුව පදනම් වන්නේ එක් අතකින් ස්වකීය මැතිවරණ දිස්ත්‍රික්කයේ සජීවී මහජන සාක්ෂි මතය. දෙවනුව රජයේ නිල තීරණ හා නීත්‍යානුකූල ලේඛණ මතය. ඉහතින් කී තත්ත්වයන් යටතේ නැගෙනහිර සඳහා යෝජිත 'සංවර්ධන සැළසුම්' පිළිබඳ දෙමළ බස කතා කරන ජනයා අතර වර්ධනය වන ගැඹුරු සැකයන්හි දේශපාලන විපාක කිසිසේත් සුබදායී විය නොහැකිය. පළාතේ ජනගහණයෙන් 75%ක් දෙමළ බස කතා කරනු ලැබුවද අදාළ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ වැදගත් කිසිදු ලේඛණයක් දෙමළ බසින් පළ නොවීම මෙකී සැකයන්ගේ පදනම් ශක්තිමත් කරනු ලැබ තිබේ.

සම්බන්ධන් මන්ත්‍රීවරයාගේම ප්‍රකාශයෙන් මීට නිදසුනක් සපයා ගනිමු. ඔහු මෙසේ කියයිඃ

> ***''ත්‍රිකුණාමලයේ නව වටරවුම් පාරක් ඉදිරිකිරීම් කටයුතු ආරම්භ වී ඇති බව කියනු ලැබේ. මෙම මාර්ගය දකුණෙහි සාම්පූර් ප්‍රදේශය උතුරෙහි කුච්චවේලිය හා යා කරනු ඇතැයි ප්‍රකාශිතය. ත්‍රිකුණාමලය නගරයට පිවිසීමට පෙර සරධාපුරම් ප්‍රදේශයේ හා මුත්තූර් පාරේ කිරන්දිමුනෛ ප්‍රදේශයේ සිට බැලූවිට මෙකී මාර්ගය දැනටමත් පෙනේ. හිමිකරුවන්ගේ අදහස් විමසීමකින් තොරව හා අදාළ විධිමත් ක්‍රියා පටිපාටියෙන් බැහැරව, දෙමළ සහ මුස්ලිම් ජනයාට අයත් කෘෂිකාර්මික හා නිවෙස්බද පෙදෙස් මෙම මාර්ගය ඉදිකිරීම සඳහා දැනටමත් පවරාගෙන තිබේ....අදාළ මාර්ග දෙපසින් මීටර් 100 සිට මීටර් 500 දක්වා වන රෝධක කලාපයක්ද නම් කෙරෙනු ඇති බව ප්‍රකාශිතය.....***
>
> ***''එමෙන්ම,මාවිල් ආරු හරහා සේරුවිල සිට පොළොන්නරුව දක්වාද නව මාර්ගයක් ඉදි කෙරෙමින් පවතින බව කියැවේ. පිටස්තර දිස්ත්‍රික්කවලින් ගෙන එනු ලබන දහසක පමණ සිංහල පවුල් එම මාර්ගය දෙපස ඉඩම්වල පදිංචි කිරීමේ සැළසුම් පිළිබඳවද තොරතුරු ලැබෙමින් තිබේ. මේ හා සමානව මඩකළපුව දිස්ත්‍රික්කයට අයත් වාහරෙෙ සිට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රදේශය දක්වා මාර්ගයක් ඉදි කෙරෙන බවද, සිංහල ජනපදකරණ වැඩ පිළිවෙළක් එහිද සැළසුම් කෙරෙන බවටද සැළ ය.''***

ඔහු විසින් හෙළි කරන මෙම කරුණු අවශ්‍ය නම් කොටි සංවිධානයේ අවශ්‍යතා මත අතිශයෝක්තියට නගන ලද විස්තරයක් ලෙස බැහැර කරන්නට අතැමුන්ට හැකිය. නමුත් මේ හා සමාන හෝ එසේත් නැතිනම් මීටත් වඩා සවිස්තරාත්මක තොරතුරු උග්‍ර කොටි විරුද්ධ ස්ථාවර දරන පිරිස් විසින්ද පසුගිය කාලය තුළ ගෙනහැර පා තිබේ. ඒ පිළිබඳ සැකයක් තිබේ නම් යාපනයේ මානව හිමිකම් පිළිබඳ සරසවි ආචාර්යවරුන්ගේ සංගමය විසින් හරියටම මීට වසරකට පෙර - 2007 අගෝස්තු 03 වෙනිදා - නිකුත් කරන ලද අංක 26 දරණ *Can the East be won through Human Culling?* මැයෙන් වූ විශේෂ වාර්තාව හෝ *Transcurrent.com* වෙබ් අඩවියට ඩී.බී.එස්.ජෙයරාජ් විසින් පසුගිය වසරේ ඔක්තෝබර් 20 වෙනිදා ලියන ලද *Hidden Agenda for Demographic Change in Trincomalee* නමැති ලිපිය හෝ කියවීම පමණක් වුව සෑහේ.

## යුද තුලනය හා දේශපාලන බල තුලනය

නැගෙනහිර ස්ථිරසාර ජය පිළිබඳ අධි විශ්වාසය රජයේ සැණකෙළි සැළසුම් හඹා එන බූමරංගයක් බවට පෙරළීමට ඇති අවකාශය අවතක්සේරු නොකළ යුත්තේ ඒ නිසාය. දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය නැගෙනහිර සටන් බොහෝමයකදී පසුබැස ගිය බව ඇත්තකි. එහි ප්‍රතිඵල වශයෙන් ඔවුන් යටතේ ඒ තාක් කල් පැවැති පාලන බල ප්‍රදේශයන් පෙරළා රජයේ හමුදාවන් විසින් අත්පත් කරගත් බවද ඇත්තකි. නමුත් එමගින් වෙනස් කළ මූලික යථාර්ථය නැගෙනහිර යුද බල තුලනයයි. දේශපාලන බල තුලනය මිලිටරි මෙහෙයුම් මගින් වෙනස් කළ හැකි නොවේ. කොටි සංවිධානය යනු පළමුව දේශපාලන බල තුලනයේ වාසිදායක කොන්දේසි මත ස්වකීය යුද ශක්තිය වර්ධනය කොටගත් ව්‍යාපාරයකි. ඔවුන් අත් කරගත් යුද ශක්තිය පසුකාලීනව පෙරළා ඔවුන්ට වාසිදායක දේශපාලන බල තුලනයක් නිර්මාණය කිරීමට ඉවහල් වන ලෙස ප්‍රත්‍යාවර්ථකව බලපෑ බව ඇත්තකි. නමුත් සුළු අවි අතින් ගත් ගැටවර කණ්ඩායමක් තීරණාත්මක යුද ශක්තියක් සහිත ගරිල්ලා ව්‍යාපාරයක් දක්වා වැඩී ආවේ දෙමළ ජනයා තුළ ඉකුත් දශක ගණනාව තුළ වර්ධනය වූ සාමූහික පැවැත්ම පිළිබඳ සහේතුක බිය විසින් නිර්මාණය කළ දේශපාලන කොන්දේසි මත පදනම් වෙමිනි.

මඩකළපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර දිස්ත්‍රික්කයන්හි දෙමළ - මුස්ලිම් ජන ජීවිතය වසා පැතිරයමින් තිබෙන අනාරක්ෂිත බව හා යටත් කරනු ලැබීමේ හැඟීම් දැනට පවතින යුදමය තුලනය කෙරෙහි තීරණාත්මක ලෙස බලපාන දේශපාලන බල තුලනයක් නිර්මාණය කිරීමට ඇති අවකාශය සුවිශාලය. දැනටමත් කොටි සංවිධානයේ දේශපාලන ක්‍රියාකාරීත්වයන් ඉහත ප්‍රදේශ තුළ ප්‍රතිසංවිධානය කෙරෙමින් ඇති බවට වාර්තා පළවෙමින් තිබේ. දෙමළ සන්ධාන මන්ත්‍රීවරයා විසින් ජූලි 23 වෙනිදා පාර්ලිමේන්තුවේදී කරන ලද කතාව එළඹෙන වකවානුවට අදාළ යථාර්ථයන්ගේ පසුබිම හකුළා දැක්වීමක් සේ සැළකිය යුත්තේ එහෙයිනි. පිල්ලෙයාන් ගැළවුම්කරුවෙකු වනු ඇත්තේ එකී යථාර්ථයන් නිශ්චිත දේශපාලන හැඩහුරුවක් ගන්නා තෙක් පමණි.

**නවීරත්**

*'සියත'' - 2008 අගෝස්තු 03*